ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/1/5/2/GEN 10 | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2021.03.04 |
|---|---|---|---|---|---|

දකුණු පළාත්,
ආණ්ඩුකාර ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
සභා ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් (ප්‍රධාන../කෘෂිකර්ම../ධීවර../අධ්‍යාපන../ක්‍රීඩා..)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා/සැලසුම්)
සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්,
පළාත් ආදායම් කොමසාරිස්,

**රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST-2/05/POL/0094 හා 2021.02.09 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, 2020.10.16 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 18/2020 පාදක කරගනිමින් පහත සඳහන් පරිදි ආයතන කටයුතු සිදු කිරීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් උපදෙස් ලබා දී ඇත.

i. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ:18/2020 නිකුත් කරන ලද 2020.10.16 දිනට පසුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ:01/2014(VIII) මගින් උපදෙස් ලබාදී ඇති පරිදි තවදුරටත් උසස් වීම් ලබා දීමට කටයුතු සිදු කිරීමට හැකියාවක් නොමැති බවත්, ඒ අනුව, 2020.10.16 දිනට පසුව ඔබගේ නිර්දේශ සහිතව මා වෙත යොමු කරනු ලබන නිලධාරීන්ගේ උසස් වීමේ කටයුතු සිදු කිරීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 18/2020 අනුව අදාල පාඨමාලාව සම්පූර්ණ කරනු ලබන නිලධාරීන්ට පමණක් අදාල සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව උසස් වීම් ලබා දීමට හැකියාව පවතින බව.

ii. එසේම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ:18/2020 හි 03 ඡේදයේ 3.1 අනුව 2007.07.01 දින සිට මෙම චක්‍රලේඛය බලාත්මක වන දින තෙක් විවෘත හෝ සීමිත හෝ කුසලතා හෝ යන ඕනෑම පදනමකින් නව තනතුරකට බඳවාගනු ලැබූ මෙතෙක් අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන නොමැති සියලුම නිලධරයන් තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාවේ ප්‍රවීණතාව මෙම චක්‍රලේඛය බලාත්මක වන දින සිට එනම් 2020.10.16 දින සිට වසර 03ක් ඇතුළත චක්‍රලේඛයේ 02 ඡේදය පරිදි අත් කර ගත යුතු බවත් 3.2 අනුව මෙම චක්‍රලේඛය බලාත්මක වන දින සිට එනම් 2020.10.16 දින සිට විවෘත හෝ සීමිත හෝ කුසලතා හෝ යන ඕනෑම පදනමකින් සේවයට බැඳෙන සියළුම නිලධරයන් පත්වීම් දින සිට වසර 03ක් ඇතුළත තමන්ට නියමිත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු බව.

iii. ඒ අනුව, ඉහත ii ඡේදයේ සඳහන් පරිදි අදාල වසර 03 සම්පූර්ණ වන තෙක් වැටුප් වර්ධක ගෙවීමට හැකියාව පවතින බවත්, එම වසර 03 අවසන් වන තෙක් ද අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කිරීමට නොහැකි වූ නිලධරයන්ට ලබාදිය යුතු වැටුප් වර්ධකය නියමිත සුදුසුකම් සම්පූර්ණ කරන තෙක් නතර කිරීමට කටයුතු කළ යුතු බව.

iv. එසේම, 2019.10.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014(VIII) අනුව උසස් වීම් ලබා ඇති මෙතෙක් අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ නොකරන ලද නිලධරයන්ට අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කරන තෙක් වැටුප් වර්ධක ලබා දීමේ හැකියාවක් නොමැති බව.

03. මෙහිදී 2020.10.16 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ:18/2020 හි සඳහන් කරුණු එලෙසින්ම බලපැවැත්වෙන බව කාරුණිකව දන්වා සිටින අතර එහි සඳහන් කරුණු සඳහා වැඩිමනත් වශයෙන් සිදුකරන ලද පැහැදිලි කිරීමක් පමණක් මෙම ලිපියේ සඳහන් වන බවද වැඩිදුරටත් සඳහන් කරමි.

04. ඒ අනුව, ඉහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කර ඔබ අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතනවල සිටින සියළුම නිලධාරීන්ගේ ආයතන කටයුතු සිදු කරන ලෙසත් ඉහත කරුණු සම්බන්ධයෙන් ඔබ යටතේ පවතින සියළුම ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමට කටයුතු සිදු කරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ප්‍රසාදිනී බෝමිරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (ආයතන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
දකුණු පළාත.

පිටපත්:
01. සහකාර ප්‍රධාන ලේකම් (පාලන) - අ.ක.ස.